# ශ්‍රී ලංකාවේ කඳුකර නොඉඳුල් වන අභය භූමියේ පෘෂ්ඨවංශීය සතුන්ගේ විවිධත්වය

කේ. බී. රණවක, සහ සී. එන්. බී. බඹරදෙණිය
පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සත්ත්ව විද්‍යා අංශය.

හෙක්ටයාර් 22,380 ක භූමි ප්‍රමාණයක් වසා සිටින කඳුකර නොඉඳුල් වන අභයභූමිය ශ්‍රී ලංකාවේ මධ්‍යම සහ සබරගමු පළාත් දෙක අතර වූ මායිමෙන් දෙපසට විහිදී යයි. මේ ප්‍රදේශය රත්නපුරය අසළදී දකුණු දිග පහත් බිමේ සිට සානුවක් කරා සීඝ්‍රයෙන් ඉහළ නගින අතර (මී. 50) මීටර් 600 ක සාමාන්‍යයකින් යුතුව පැතිර ගොස් මීටර් 2238 දී ශ්‍රී පාද කන්ද වැනි කඳුවලින් විච්ජින්න වේ. මෙය, කැළණි ගඟ, කළු ගඟ සහ වලවේ ගඟ යන ප්‍රධාන ගංඟා පද්ධති තුනක් සඳහා වූ වැදගත් දිය බෙත්මක් වේ.

වනාන්තර මීටර් 600 සිට 800 අතරතුරදී කඳුකර වැසි වනාන්තරවලට අනුක්‍රමයෙන් මං පාදාලන අතර, එහි කැපී පෙනෙන ලක්ෂණයක් වශයෙන් පහත වනවියනක් තිබේ. මීටර් 1700 කට ඉහළින් ඇති කඳුකර මේඝ වනාන්තරය ශ්‍රී පාද කන්දේ මුදුන් රේඛාව දිගේ සහ බෑවුම් ඔස්සේ ඇති පටු තීරුවකට සීමාවන අතර, උසට නොවැඩුණු ගස්වලින් යුක්ත වේ.


වලි කුකුලා

නිරන්තර තෙත් කලාපයක් වන මෙහි මි. මි. 3000 කට අධික මධ්‍ය වාර්ෂික වර්ෂාපතනයක් පවතී.

අඛණ්ඩ වූ ද, පහත රට වැසි වනාන්තර, උප - කඳුකර වැසි වනාන්තර සහ කඳුකර මේඝ වනාන්තර යනුවෙන් උන්නතාංශීය වශයෙන් වර්ග කරන ලද්දා වූද ප්‍රධාන වැසි වනාන්තර තුනකින් මේ අභය භූමිය සමන්විත වේ. මේ කලාපයේ පහල බෑවුම්වල දක්නා ලැබෙන පහතරට වැසි වනාන්තරවල කැපී පෙනෙන ලක්ෂණයක් නම් මීටර් 30 - 40 ක් උස් අඛණ්ඩ වන - වියන වන අතර ඇතැම් තැන්වලදී මීටර් 60 ක් පමණ ඉහළට මතුවෙන උසින් වැඩි තනි වෘක්ෂවලින් එහි අඛණ්ඩ භාවයට බාධා වේ. පහතරට

මේ අභය භූමියේ වෙසෙන පෘෂ්ඨවංශික සතුන් පිළිබඳ අධ්‍යයනයක් 1995 අප්‍රේල් මාසයේ සිට ඔක්තෝබර් මාසය අතර කාලය මුළුල්ලේ කරන ලද අනුච්ඡෙද සමීක්ෂණයකදී සිදු කරන ලදි. මෙකී කාලසීමාව තුළදී අංක 01 රූප සටහනේ දැක්වෙන මහ සලකුණු දැඩි ලෙස සමීක්ෂණයට භාජනය කරන ලද අතර, ඍජු සහ වක්‍ර යන දෙයාකාරයේ ම නිරීක්ෂණ මඟින් පෘෂ්ඨවංශිකයන් සටහන් කර ගන්නා ලදි. (එනම් - හඬ නැඟීම්, ගමන් මාර්ග, මල පහකිරීම. ගොදුරු පිණිස භාවුන් / ඉතිරි වූ ඇටකටු සඳහා දිවියා පිළිබඳ විකීරණ විශ්ලේෂණ වැනි කරුණු) මෙකී අභය භූමියේ වෙසෙන පෘෂ්ඨ වංශික සතුන්ගේ විවිධත්වය අධිකවීම සඳහා

අඛණ්ඩ වෘක්ෂලතා යායවල්, ප්‍රමාණවත් ජලය, ඉතා යෝග්‍ය දේශගුණ විද්‍යා තත්ත්වයන් සහ විශාල සංඛ්‍යාවක වාසභූමි ද හේතු වේ.

අධීක්ෂණයට භාජනය කරන ලද සත්ව විශේෂ කීපය අතරින් ඒකදේශීය සතකු වන Stone sucker (Garra ceylonensis) මේ වනාන්තරයේ වේගයෙන් ගලා බස්නා ඇල - දොලවල බහුලව සිටින බැව් පෙනී ගියේය. අමුතුවෙන් හඳුන්වා දෙනු ලැබූ ගප්පියා වනාන්තරයට යාබද ගම් හරහා ගමන් කරන ඇල - දොලෙහි බහුලව දක්නා ලැබිණ.

කුල තුනකට අයත් උභයජීවී විශේෂ නවයක් මෙහිදී ලේඛනගත කරන ලදි. ඒකදේශීය විශේෂ හතරක් මේවාට ඇතුළත් විය. (ලැයිස්තුව 01) මෙහිදී නිරීක්ෂණය කරන ලද අතිරේක විශේෂ දෙකක් හඳුණා ගැනීම (ගස් ගෙම්බකු සහ මැඩියකු - නව විශේෂයන් විය හැකිය.) තවදුරටත් විමර්ශනය කොට පැහැදිලි කරගැනීම අවශ්‍ය වේ. සාපේක්ෂක වශයෙන් සිසිලන ඌෂ්ණත්වය ද අධික ආර්ද්‍රතාව ද සුලභ වර්ෂාපතනය ද මෙකී උභය ජීවීන් සඳහා වූ ඉතා යෝග්‍ය දේශගුණ විද්‍යා තත්ත්ව ලෙස ප්‍රයෝජනවත් වේ. ගස් ගෙම්බෝ (Rhacophorid) යටින් පිහිටි පඳුරු තට්ටුවල සහ කොළරොඩු හා බිමට වැටුනු කඳන්වල වාසය කළහ. ඔවුන්ගේ වර්ණ රටා මෙකී පරිසරයට හොඳින් ගැලපී මුසු විය.

මෙහිදී නිරීක්ෂණය කරන ලද උරගයන්ට කටුසු විශේෂ පහක් (ඒකදේශීය විශේෂ තුනක්) ද එක් සිකනලකු සහ සර්ප විශේෂ තුනක් ද (ලැයිස්තුව 02) අයත් විය. පලා පොළඟුන්, මොල්ලි පොළඟුන්, කරවැලුන් සහ ගල් පිඹුරන් වැනි තවත් සර්පයන් ගම්මුන්ගෙන් ලබාගත් තොරතුරුවලට ඇතුලත් විය.

කුල 33 කට අයත් පක්ෂි විශේෂ 93 ක් අධ්‍යයන කාලය තුළදී ලේඛනගත කරන ලදි. ඒකදේශීය විශේෂ 19 ක්ද සිසිර සෘතුවේදී සංක්‍රමණය වන විශේෂ හයක් ද මීට ඇතුලත් විය. (03 වැනි ලැයිස්තුව) පහත රට වැසි වනාන්තර ප්‍රදේශය තුළ (මීටර් 700 ට අඩු) පක්ෂීන්ගේ විවිධත්වය අධික වූ අතර, උන්නතාංශකය ඉහළ යාමේදී ඔවුන්ගේ විවිධත්වය ක්‍රමයෙන් අඩු විය. මිශ්‍ර විශේෂවලට අයත් ගොදුරු සොයා යන කුරුළු රැන් පහත රට වැසි වනාන්තර ප්‍රදේශවල සුලභව දක්නට ලැබුණු දෙයක් වූ අතර, එක් රැනක කුරුල්ලන් 80 ක් පමණ වූ කුරුළු විශේෂ 17 ක් පමණ විය. නිරීක්ෂණය කරන ලද පක්ෂීන් අතරින් වැඩි දෙනා කෘමිභක්ෂක විශේෂවලට අයත් විය.

කුල 13 කට අයත් ක්ෂීරපායී විශේෂ 23 ක් අභය භූමියෙන් ලේඛනගත කරන ලදි. (ලැයිස්තු අංක 04). මේවාට ඒක දේශීය විශේෂ තුනක් අයත් විය. දම්පාට මුහුණක් සහිත ඒකදේශීය ලැන්ගුවර් වඳුරන්ගේ (Presbytes senex Vetulus සහ Perspytes Senexnestor) උප විශේෂ දෙකක් මෙහිදී නිරීක්ෂණය කරන ලදි.

උප කඳුකර කලාපය (මී. 700 - 1300) තුළ කුඩා අලි කණ්ඩායමක් (6-8 දෙනෙකු පමණ) වෙසේ. මෙහි වෙසෙන දිවියන් පිළිබඳ විකීර්ණ විශ්ලේෂණයකින් හෙළි වූයේ ඔවුන් ගෝනුන්, මුවන්, ඉත්තෑවුන් සහ මීයන් ගොදුරු කර ගන්නා බවය.

මෙහිදී නිරීක්ෂණය කරන ලද පෘෂ්ඨවංශිකයන්ගේ මුළු ගණනින් 25% ක් ජාතික වශයෙන් අනතුරට ලක් වූ සත්ව විශේෂ ලෙස ලැයිස්තුගත කරනු ලැබ ඇත. (විජේසිංහ සහ තවත් අය, 1993). ක්ෂීරපායී විශේෂ 10 ක් ද පක්ෂි විශේෂ 15 ක්ද, උරග විශේෂ හතරක් ද උභයජීවී විශේෂ හතරක්ද එක් මත්ස්‍ය විශේෂයක්ද මේවාට ඇතුළත් වේ. මෙහි වෙසෙන ක්ෂීරපායි විශේෂ දෙකක්ද පක්ෂි විශේෂ හයක් ද ලෝකයේ අනතුරට ලක්ව ඇති සතුන් පිළිබඳ 1988 ස්වභාව සංරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සංගමයේ රතු ලැයිස්තුවේ ඇතුළත්ව ඇත. පහසුවෙන් අනතුරට පත්විය හැකි මෙකී



තද තිල් මැසිමාරා

පාෂ්ඨවංශික විශේෂයන් ආරක්ෂා කරගනු පිණිස මෙකී නොඉඳුල් කඳුකර වන අභයභූමිය සංරක්ෂණය කිරීමේ වැදගත්කම මෙයින් පෙන්නුම් කෙරේ.

උප කඳුකර වනාන්තර කලාපයේ ඝන අධෝ ස්ථරය බොහෝ ස්ථානවලදී විනාශයට පත්ව අඩුවී ගොස් තිබුණි. ඝන නිල්ලු පඳුරු තට්ටුව (Strobylanthes sp.) චක්‍රීය වශයෙන් නැසී යාමත්, සාමාන්‍ය උණ ගස් (Ochlandra sp.) ගම්වැසියන් විසින් අධික ලෙස තම ප්‍රයෝජනයට යොදා ගැනීමත් මෙයට හේතුවූවා විය හැකිය. වනාන්තරයේ බිම් තට්ටුවේ තෙතමනය අඩුවීමටත් එය බොහෝ උභයජීවීන්ගේ හා උරගයන්ගේ වාසභූමිවලට අහිතකර ලෙස බලපා ඔවුන්ගේ ගහනය ක්‍රමයෙන් පහත වැටීමටත් මෙය හේතුවිය හැකිය. නීති විරෝධී ලෙස අනවසරයෙන් ඉඩම් අල්ලා ගැනීම, ස්වභාව ධර්මයෙන් හෝ මිනිසා විසින් ඇති කරන ලද ගිනි, හොරෙන් අල්ලා දඩයම් කිරීම සහ මේ අභයභූමියට යාව පිහිටි කෘෂිකාර්මික ඉඩම්වල රසායනික ද්‍රව්‍ය වැඩි වැඩියෙන් යෙදීම ද මෙකී පෘෂ්ඨවංශිකයන්ගේ අනාගත පැවැත්මට තිබෙන අනෙක් තර්ජන වේ.

---

## ආශ්‍රිත ලේඛන


(1) අයි. යූ. සී. එන් (1990) - දකුණු ආසියානු රක්ෂිත ප්‍රදේශ පිළිබඳ අයිසීයූඑන් නාමාවලිය. අයිසීයූඑන්, ග්ලෑන්ඩ්, ස්විට්සර්ලන්තය.

(2) විජේසිංහ , අයි. සී. ඒ. ද එස්, ගුණතිලක, අයි. ඒ. යූ. එන්, ජයවර්ධන, එස්. ඩී. ජී., ගුණතිලක, සී. වී. එස්. සහ කොටගම එස්. ඩබ්., (1993) ශ්‍රී ලංකාවේ ජීව විද්‍යාත්මක සංරක්ෂණය - ජාතික තත්ත්ව වාර්තාවක් - අයියූසීඑන්, කොළඹ 5 ශ්‍රී ලංකාව.

(3) සිංහකුඹුර බී. එම්. පි. (1995) ශ්‍රී පාද නොඉඳුල් වනයේ ශාඛ සමීක්ෂණය. ශ්‍රී ලංකා කැලෑ දෙපාර්තමේන්තුව.

(4) වර්නර් ඩබ්ලිව්. එල්. සහ ශ්වේයින් පර්ත් යූ. (1985) - Naturraserrate in Hochland der linsd ceylon (Sri Lanka) Peal wildemess and Horton plains - Nature

(3) ෆ්‍රැන්ක් ෆර්ට්.


**ලැයිස්තු අංක 01 - කඳුකර නොඉඳුල් අභය භූමියේ නිරීක්ෂිත උභයජීවීන්**

| කුලය | පොදු නාමය | විද්‍යාත්මක නාමය |
|---|---|---|
| රැකෝ පොරිඩා Pheaophoridae | (1) කත් කොට ගස් ගෙම්බා #@ | Phaeophorus Microtympanus |
| | (2) පටිසහිත මිටි ගස් ගෙම්බා | Philantus Leueorhinus |
| | (3) විපර්ය ගස් ගෙම්බා | Philantus Variabilis |
| | (4) හොටය උල් ගස් ගෙම්බා | Philantus Nasutus |
| | (5) පැතැටි ගස් ගෙම්බා # | Polypedates Cruciger |
| | (6) කඳුකර පැතැටි ගස්ගෙම්බා #@ | Polypedates eques |
| රැනිඩා Ranidae | (7) රැලි ගැසුණු ගෙම්බා #@ | Limnonetes Corrugatus |
| | (8) වෙල් ගෙම්බා | Limnonectes limnochavis |
| බුෆොනිඩා Bufonidae | (9) පොදු ගෙමැඩියා | Bufo melanostictus |

**ලැයිස්තු අංක 02 - කඳුකර නොඉඳුල් වන අභය භූමියේ දක්නට ලැබුණු උරගයන්**

| කුලය | පොදු නාමය | විද්‍යාත්මක නාමය |
|---|---|---|
| අගම්ඩා Agamidae | (1) කොළ ගෙවතු කටුස්සා # | Colotes Calotes |
| | (2) පොදු ගෙවතු කටුස්සා | Colotes Versioolor |
| | (3) අකර්ණ කටුස්සා #@ | otocryptisweigmanni |
| | (4) රයිනෝ - අංකටුස්සා #@ | Cerataphora stoddarti |
| | (5) මොල්ලි - හොට කටුස්සා #@ | Lyriocephalus Seutatus |
| සින්සිඩා Scincida | (6) සිකනලා | Mahuya sp |
| කොලුබ්‍රිඩා Colubridaa | (7) ගැරඩියා | Ptayas sp |
| එලැපිඩා Elapidae | (8) නයා | Naja naja |
| වයි පරිඩා Vi perridae | (9) තිත් පොළඟා | Vipera russelli |

ලැයිස්තු අංක 03 - කඳුකර නොඉඳුල් වන අභය භූමියේ දක්නට ලැබුණු ඇතැම් පක්ෂීන්

| කුලය | පොදු නාමය | විද්‍යාත්මක නාමය |
|---|---|---|
| පික්නොනෝටිඩා Pycnonotidae | (1) කොවුලා #@ | Pycnonotus Penicilatus |
| | (2) හිස කළු කොවුලා @ | Pycnonotus luteolus |
| මුසිකැපිඩා Muscicapidae | (3) හිස දුඹුරු බැබ්ලර් @ | Pellornem luteolus |
| | (4) රත්දුඹුරු බැබ්ලර් #@ | Turdoies rufescens |
| | (5) තද නිල් මැසි මාරා #@ | Muscicapa Sordida |
| | (6) තිත් පිහාටු සහිත ගී කුරුල්ලා #@* | Toothera Spiloptera |
| | (7) ශ්‍රී ලංකා හම්බු කුරුල්ලා #@ | Bradupterus Palliseri |
| ෆැෂියනිඩා Phasianidae | (8) වලි කුකුළා #@ | Gallus lafayetti |
| සිටැසිඩා Psittacidae | (9) | Loriculus beryllinus |
| | (10) ලෙයාඩ් බටුහිරවා @ | Psittacula Calthropae |
| කුකුලිඩා Cuculidae | (11) හොටය කොළ පැහැති #@* | Centropas chlororhynchus |
| බුසිරොටිඩා Bucerotidae | (12) - | Tochus gingalensis |
| කැපිටොනිඩා Capitonidae | (13) පුංචි කොට්ටෝරුවා #@ | Xantholaema rubricapilla |
| | (14) ඉදිරිපස කහපාට කොට්ටෝරුවා #@ | Cyanops flavivons |
| ස්ටර්නිඩා Sturnidae | (15) හිස සුදු ස්ටාර්ලිං කුරුල්ලා #@* | Starnus Seneu |
| | (16) #@ | Graeula Ptilogenys |
| කෝර්විඩා Corvidae | (17) නිල් පොල්කිච්චා #@* | Cissa ornata |
| ඩයිකඩා Dicoedae | (18) #@* | Dicaeum Vincenc |
| සොස්ටිරොපිඩා tosteropidae | (19) @ | Zosterops ceylonensis |
| ට්‍රොගොනිඩා Trogonidae | (20) ට්‍රොගන් # | Harpectes fasciatus |
| පයිසිඩා Picidae | (21) උදරයේ කොරපොතු සහිත කොට්ටෝරුවා # | Picus xanthopygaeus |

ලැයිස්තු අංක 04 කඳුකර නොඉඳුල් වන අභය භූමියේ දී නිරීක්ෂණය කරන ලද ක්ෂීරපායී සතුන්

| කුලය | පොදු නාමය | විද්‍යාත්මක නාමය |
|---|---|---|
| සර්විඩා Cervidae | (1) ගෝනා | Cervus Unicolouv |
| | (2) මීමින්නා | Tragulus Meminna |
| | (3) ඕළු මුවා | Muntiacus Muntjak |
| සූඩා Suidae | (4) වල් ඌරා | Sus Scrofa |
| සරකොපිතසිඩා Sercopithecidae | (5) | Macaca Sinica |
| | (6) මුහුණ දම්පාට කොළ වඳුරා #@ | Presbytes Senex |
| සූරිඩා Sciuridae | (7) ලොකු ලේනා | Ratufa Macrouva |
| | (8) - | Funambulus palmarum |
| | (9) ගිනි ඉරි සහිත වල්ලේනා # | Funambulus |
| | (10) මඳ කළු ඉරිසහිත වල්ලේනා # | Funambulus Sublineatus |
| ස්ටිස්ට්‍රිසිඩා Stistricidae | (11) ඉත්තෑවා | Histrix indica |
| මියුරිඩා Muridae | (12) ඌරුමීයා | Bandicota indica |
| | (13) පතන් මීයා #@ | Rattus Monfahus |

| | | |
|---|---|---|
| ලෙපොරිඩා Leporidae | (14) බෙල්ල කළු හාවා | Lepus nigricollis |
| එලිපන්ටිඩා Elepantidae | (15) අලියා #@ | Elepas maxomus |
| පෙලිඩා Felidae | (16) දිවියා #@ | Panthera Pardas Fusca |
| | (17) | Felis Viverrina |
| | (18) වල් බළලා # | Felis Chaus |
| මුස්ටෙලිඩා Mustellidae | (19) දිය බල්ලා # | Lutr Cutra |
| විවෙරිඩා Viverridae | (20) ඇලි මුගටියා | Herpestes fuscus |
| | (21) ඉන්දියානු උරුලෑවා | Virerrieula indiea |
| කැනිඩා Canidae | (22) හිවලා | Canis aureus |
| ටෙරොපොඩිඩා Pteropodidae | (23) ගෙඩි කන වවුලා | pteropus giganteus |

\# - ජාතික වශයෙන් තර්ජනයට ලක් වූ විශේෂ (විජේසිංහ සහ තවත් අය 1993)

@ - ඒකදේශීය විශේෂ.

* - ගෝලීය වශයෙන් තර්ජනයට ලක් වූ විශේෂ (අයි.සී.යූ.එන්. - රතු ලැයිස්තුව)




රූප සටහන 01 - කඳුරට නොඉඳුල් වන අභය භූමිය සහ ශ්‍රී ලංකාව තුළ එහි පිහිටීම දැක්වෙන සිතියම.

# හඳපානාගල අලි මිනිස් ගැටුම පිළිබඳ කඩිනම් අගැයුම සහ එම ගැටුම අවම කර ගැනීම සඳහා කෙරෙන නිර්දේශ

ඩී. පී. මුණවීර සහ වී. වයි. කුරුවිට



**සම්පිණ්ඩනය**

අතීතයේ පැලවත්ත සීනි කර්මාන්ත ශාලාව ඉදිකිරීමට පෙර මිනිසා සහ සත්වයා විසින් මෙම ප්‍රදේශයේ ඉතාමත් සහජීවනයෙන් යුතුව ජීවත්විය. මේ වකවානුවේ දී සත්වයින්ට සහ එහි ජීවිකාව කරගත් මිනිසාට උවමනා තරම් ඉඩම් ප්‍රමාණයක් හිමිව පැවතුනි. අලි රංචුවට ද හඳපානාගලට ම සීමාවී හැසිරීමේ උවමනාවක් නොතිබුණ අතර මෙම අලීන් වෙනත් ඈත ප්‍රදේශවල ද (උදාහරණ වශයෙන් යාල, ගල්ඔය, උඩවලව, ලාහුගල) සංක්‍රමණය කරනු ලැබීය. මේවාට ඔවුන් යොදා ගත්තේ ස්වාභාවික වනාන්තරවලින් සැදුනු අලිමංසලවල් ය. අද මෙම ස්වාභාවික මංසලවල් අහිමිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම සත්වයින්ට ගම්මානවලින් හා පැලවත්ත උක් වගාවලින් වටවූ කුඩා ප්‍රදේශයකට පමණක් සීමා වී ජීවත් වීමට සිදුවී ඇත. මෙසේ මෙම ප්‍රදේශයට දැරීමට නොහැකි ප්‍රමාණයේ අලි රංචුවක් කොටුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම ප්‍රදේශය තුළ මිනිස් සහ අලි ගැටුම උග්‍ර වී ඇති බව අපගේ හැඟීමයි. මෙම ප්‍රශ්නය වඩාත් උග්‍ර වනුයේ වෙනත් වතුර වලවල් සිඳී ගොස් හඳපානාගල වැවෙහි පමණක් වතුර ඉතිරිවන වියළි කාලය තුළයි. උග්‍ර ගැටුමක් පවතින ප්‍රදේශය තුළ ජීවත්වන ගොවීන්ගෙන් එක්රැස් කළ ආර්ථික දත්තවලින් පෙනී යන්නේ ගැටුම් පවතින ප්‍රදේශවල වෙසෙන ගම්මුන් යාන්තමින් එදා වේල සරිකර ගන්නා ආර්ථික මට්ටමේ ගොවීන් බවයි.

මෙම ප්‍රදේශයේ ගොවීන් ඔවුන් පාරම්පරිකව කරගෙන ආ ගොවි කටයුතු වලින් විශාල ප්‍රතිලාභයක් ලබමින් සිටියත්, දැන් මෙහි උද්ගත වී ඇති අලි ප්‍රශ්නය නිසා පාරම්පරිකව ප්‍රදේශයට ආවේනික බෝග වැවීම අතහැර දමා වෙනත් විකල්ප බෝග වගාවන් සඳහා පෙළඹී ඇත.

මෙහිදී ඔවුන් වඩාත්ම උත්සුක වී ඇත්තේ අලින් අප්‍රිය කරන බෝගයන් වගා කිරීමට මිස, ප්‍රතිඵල වැඩි, මෙම ප්‍රදේශයට සුදුසු බෝග තෝරා ගැනීමට නොවේ. මෙම බෝග වලින් ලැබෙන ප්‍රතිලාභ පෙර ඔවුන් පාරම්පරිකව කරගෙන ආ ගොවිතැන් කටයුතු වලින් ලැබුණු ප්‍රතිලාභ වලට වඩා බොහෝ අඩුවූවත්, පවතින කරදරකාරී තත්ත්වය නිසා ඔවුන්ට එම තත්ත්වයන්ට සරිලනසේ හැඩගැසීමට සිදුව ඇත. මෙහි වෙසෙන ගොවීන්ගෙන් විශාල ප්‍රමාණයක් ම දැන් යොමුවී ඇත්තේ දුම්කොල වගාවට ය. මෙම ප්‍රශ්නය වඩාත්ම බලපවත්වන ප්‍රදේශයන් වන නෙළුවාගල සහ පුබුදුගම ප්‍රදේශයන්හි වෙසෙන ගොවීන් තමන් කරගෙන ආ පාරම්පරික ගොවි කටයුතුවලින් ඈත්වී දුම්කොල වගාව කෙරෙහි යොමුවී ඇති බව කැපී පෙනෙන ලක්ෂණයකි. මෙසේ

කෙරෙන දූම්කොල වගාවෙන් විශාල ප්‍රශ්න රාශියක් පැනනැගී ඇත. මෙම ප්‍රශ්නවලට වඩාත්ම හේතුකාරක වී ඇත්තේ එක් අතකින් මේවාට යොදවන පොහොර ප්‍රමාණයන් හා කෘමි නාශක ද්‍රව්‍යයන්ට අධික වියදමක් දැරීමට සිදුවීමයි. අනික් අතින් මෙම වගාවන් තුළින් ඒවා වගා කරන ගොවි පවුල් අතර ඇදුම හා හුස්ම ගැනීමේ අපහසුතා ඇතිකරවන රෝග බහුලව පැතිරී යාමයි. අවසානයේ මේ සියළු කරුණු හේතුවෙන් මෙම ප්‍රදේශයේ ජීවත්වන පාරම්පරිකව ගොවිතැන් කටයුතු කරගෙන ආ මිනිසුන් බොහොමයක් දැන් දැන් වෙනත් විකල්ප ආදායම් මාර්ගයන් වන රජයේ සේවය හා පැලවත්ත සීනි කම්හලේ සේවකයන් ලෙස හෝ එසේත් බැරිනම් වෙනත් ගම්වල එදිනෙදා කුලී වැඩ කර තම ජීවිකාව ගැටගසා ගැනීම සඳහා යොමුව ඇත. මෙම ප්‍රදේශයේ ජීවත්වන පවුල් විශාල ප්‍රමාණයක් (99% ට වැඩි) සමෘද්ධි ලාභීන් හා ආහාර මුද්දර මත යැපෙන්නන් බව අප සමීක්ෂණයේ දී හෙලිවූ තවත් කරුණකි. කෙසේ වෙතත්, දිනෙන් දින මිනිසා හා අලියා අතර ගැටුම මෙම ප්‍රදේශයේ වැඩිවන බවක් පෙනී යන අතර මෙම ගැටළුව විසඳීමට ඉක්මන් විසඳුමක් සලසා නොදුනහොත් අලින්ට කිසිම අනුකම්පාවක් ලැබෙනු ඇතැයි කෙනෙකුට සිතිය නොහැකිය යන්න අපගේ අදහසයි. මෙය වැඩිදුරටත් තහවුරු වන්නේ එම ගම්මුන් පොදු සතුරා විනාශ කිරීම සඳහා භාවිතා කිරීමට පුරුදු වී සිටින වෙනත් සියුම් ක්‍රම හා උප්පරවැට්ටි ගැන සිතනවිටය.

1991-1994 යන කාලය තුළ මෙම ප්‍රදේශයේ අලි 11 දෙනෙක් මැරී සිටිනු දක්නට ලැබුනු අතර එයින් 5 දෙනෙක් දක්නට ලැබුනේ අලි මිනිස් ගැටුම උග්‍රව පැවතුන පුබුදුගම ගම්මානයේය. මෙයින් තවත් අලි 2 ක් මැරී සිටියේ නෙළුවගල ප්‍රදේශයෙහිය. කෙසේ වෙතත් මෙම ප්‍රදේශයේ දැනට ජීවතුන් අතර සිටින අලින්ගේ සෑම සතෙකුගේ ම සිරුරේ තුවක්කුවලින් ලද තුවාල පහ හයක්වත් ඇති අතර, එසේ නැති සතෙක් සොයා ගැනීම වඩාත් අසීරුය. මිනිසුන්ට සෘජුව මුහුණ දෙන අවස්ථාවලදී අලින්, මිනිසුන් ඝාතනයට යොමුවීමත් සමඟ දෙපාර්ශවය අතර එදිරිවාදිකම් තවදුරටත් වර්ධනය වනු ඇත.

මෙහිදී එකිනෙකා අතර වරද පටවා ගන්නා අතර මෙම තත්ත්වය පාලනය කර නොගතහොත් මිනිසුන් ඝාතනයට ලක්කරන අලින් සංඛ්‍යාව විශාලවන අතර රජයට ගම්මුන් ආරක්ෂාකර ගැනීමේ ක්‍රියාවලිය තුළ එම අලින් විනාශ කිරීමට ද සිදුවනු නොඅනුමානය. එබැවින් මේ පිළිබඳව වගකීම් දරණ රජයේ ආයතන හා නිලධාරීන් මේ සඳහා ඉක්මන් තීරණයක් ගැනීමේ අවශ්‍යතාව දැන් අතලඟය. මෙහිදී ඔවුන්ගේ සමාජීය හා පරිසරාත්මක තත්ත්වයන් සලකා බලා තීරණයක් ගන්නේ නම් මැනවයි අපගේ අදහසයි. සියළුම වගකිව යුතු නිලධාරීන් දේශපාලනඥයන් හා වනජීවී නිලධාරීන් ද ඇතුළත්ව මෙම තත්ත්වය වටහාගෙන මෙය ඉතාමත් ම භයානක තත්ත්වයක් බව තේරුම්ගෙන ඒ සඳහා ඉක්මන් විසඳුමක් සෙවීම කාලෝචිත යයි මෙහිදී පෙන්වා දෙමු. මෙහිදී කළ සමීක්ෂණය අනුව මේ තත්ත්වය විසඳීම සඳහා අදියර දෙකක් තුළ ක්‍රියාකල යුතු බව අපගේ හැඟීමයි. පළමු අදියර කෙටිකාලීන එකක් වන අතර අනෙක මෙම ප්‍රදේශයේ ගැටුම සමනය කිරීමට යෝජනා කරන දිගුකාලීන සැලැස්මකි. කෙටිකාලීන සැලැස්ම හුදෙක්ම පදනම් වී ඇත්තේ දැනට මෙම ප්‍රදේශය තුළ ජීවත්වන මිනිසාගේ සමාජීය හා ආර්ථිකමය තත්ත්වයන් ආරක්ෂාකරමින් ගැටළුවට පාත්‍රවී සිටින අලි රංචුව මුදවා ගහැරීමට කටයුතු කිරීමයි. එනම් කෙටිකාලීන විසඳුමට මූලිකවම හේතුවී ඇත්තේ දැනටමත් අධික ගැටුමක් පවතින ප්‍රදේශය තුළ ජීවත්වන මිනිසුන් පැලවත්ත සීනි කර්මාන්ත ශාලාව මත තමාගේ ආර්ථිකය ගැටගසා ගැනීමට යොමුවී සිටීමයි. සමහරෙක් තමන්ගේ ඉඩම්වල උක් ගස් වවා පැලවත්තට විකිණීමට පුරුදුව ඇත. තවත් සමහරෙක් කෙලින්ම පැලවත්තේ කම්කරුවන් බවට පත්වී ඇත. මේ අනුව මෙම ප්‍රදේශයේ ජීවත්වන ගොවීන්ගෙන් බොහෝ දෙනෙක් තමන්ගේ පාරම්පරික ජීවන රටාව වෙනස් කොට අද පවතින තත්ත්වයට මුහුණ දීම සඳහා තම ජීවිත හැඩගස්වාගෙන ඇත. පළමුව මේ තත්ත්වය තේරුම්ගෙන අදට මෙම ප්‍රදේශයේ ජීවත්වන මිනිසාට අවශ්‍ය පසුබිම සකස් කොට තාවකාලික තත්ත්වයක් සකස් කොට දී දෙවනුව පැනනැගුනු ප්‍රශ්න තුලින් දිගුකාලීන සැලැස්මකට ඉදිරිපත් විය යුතු ය යන්න අපගේ හැඟීමයි.

මෙම තාවකාලික සැලැස්ම තුළ අප ඉදිරිපත් කර ඇති යෝජනා අතර, මෙම ප්‍රදේශයේ සිටින භයානක, නිදැල්ලේ හැසිරෙන අලින් අල්ලා වෙනත් ආරක්ෂිත ප්‍රදේශයන් තුළ මුදාහැරීම, නෙළුවගල එනම් හඳපානාගල වැව් ඉස්මත්තේ වාසය කරන පවුල් එම ප්‍රදේශයෙන් ඉවත් කොට වෙනත් සුදුසු ප්‍රදේශයන් තුළ පදිංචි කරවීම, පැලවත්ත මගින් පාලනයවන වැව් ඉස්මත්තේ ඇති දැනටමත් උක් වගා කර ඇති ප්‍රදේශය සතුන් සඳහා මුදා හැරීම, හඳපානාගල ප්‍රදේශය හා යාල වනෝද්‍යානය සම්බන්ධ කිරීම සඳහා වූ මංසලවල් ඇතිකිරීම, භෝග විනාශය සහ මිනිස් ජීවිත හානිය සඳහා ප්‍රමාණවත් රක්ෂණ වන්දි ගෙවීමක් සකස් කිරීම, යාල බ්ලොක් 3 හා 4 යන කොටස් වල ඇති වැව් අලුත්වැඩියා කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම ආදී යෝජනා මූලිකත්වය ගනී.

දිගුකාලීනව මෙම තත්වය මැඩ පැවැත්වීමේ ක්‍රියාවලිය තුළ දිගුකාලීන සැලැස්මක් ඉදිරිපත් කරන ලදී. මෙහිදී වඩාත්ම සැලැකිල්ලට යොමු කරන ලද්දේ තාවකාලිකව යෙදූ උප්පරවැට්ටි කොයි තරම් දුරට දිගුකාලීනව සෑහේද යන්න පරීක්ෂණයට ලක් කිරීමයි. බොහෝ දුරට මංසල තුලින් යාල අභයභූමියට පලවා හරින අලි නැවතත් මෙම ප්‍රදේශයට ම ඒමේ ඉඩකඩ ඉතා වැඩිය. එසේ ආවොත් තත්ත්වය මෙසේ ම පැවතුනොත් නැවතත් පෙර ප්‍රශ්නය ඉස්මතු වීම වැලැක්විය නොහැක. මේ සඳහා බලපෑමට ලක් වී ඇති ප්‍රදේශ තුළ ගැටුම් විසඳීමේ කමිටු පිහිටුවීම, ප්‍රදේශය තුළ අලින්ගේ හැසිරීම් රටා අධ්‍යයනය කිරීම සඳහා පර්යේෂණ

ඒකක පිහිටුවීම හා එමගින් මෙම ප්‍රදේශය තුළ අලින් රඳවා ගැනීමේ ධාරිතාව නිගමනය කිරීම සඳහා විද්‍යාත්මක අධ්‍යයනයන් කිරීම, පාරිසරික අධ්‍යයනයකින් පසු යෝග්‍ය නම් පමණක් වාස භූමි සරුසාර කිරීම (යාල බ්ලොක් 3 සහ 4) මෙම ප්‍රදේශයේ ඇති පැලවත්ත කර්මාන්ත ශාලාවෙන් සිදුවෙන සේවය හා යාල ජාතික අභයභූමිය සංසන්දනය කිරීමේදී සීනි කර්මාන්ත ශාලාව මගින් ඇතිවන පාරිසරික, සාමාජීය හා ආර්ථිකමය වටිනාකම් සැසඳීම සඳහා අධ්‍යයනයක් කිරීම හා ඒ තුළින් සීනි කර්මාන්ත ශාලාව තවදුරටත් පවත්වාගෙන යනවාද නැද්ද යන්න තීරණය කිරීම ආදිය යෝජනා කර ඇත.

## හැඳින්වීම

සෑම වසරක ම පවතින වියළි සෘතුව තුළ (ජූලි සිට සැප්තැම්බර් දක්වා) හඳපානගල වැවේ ඇති ජල සම්පත පාවිච්චියට ගැනීමෙන් හා ඒ අවට ඇති තේක්ක වන වගාව තුළ රැකවරණය ලබමින් වල් අලි 120-150 ක් පමණ රංචුවක් ඒ අවට ගැවසෙති. විවිධ වංශ හා පවුල් කීපයකට අයත් මෙම සතුන් වියළි කාලය තුළ එකට එකතු වී රංචුවක් සේ හැසිරෙන බව පසුගිය වර්ෂවලදී අප ලද අත්දැකීම් තුළින් පෙනීයයි. අලුයම් කාලයේදී විසිරී යන මෙම අලි රංචුව තම තමන්ගේ වැඩිහිටි නායක අලි කීපදෙනෙකු යටතේ කුඩා පවුල් ඒකක වශයෙන් එක් රොක් වීමෙන් මේ බව වඩාත් තහවුරු වේ. කෙසේ වුවද හැන්දෑ වන විට හඳපානගල වැවේ පොදු ජල සම්පත හවුලේ බෙදාහදා ගැනීම පිණිස මෙම සත්තු යලි එකට එක්වෙති. කෙසේ වෙතත් තේක්ක කැලෑවේ හව්හරණය ලබමින් සතුන් 30-40 කින් සමන්විත අලි රංචුවක් මෙම ගම්මානයට නුදුරින් වෙසෙන බව අපි පිලිගනිමු. විශේෂයෙන් වියලි කාලයන් තුළ, සෑම වසරකම අලි විශාල රංචුවක් අධික ලෙස තෘණ වර්ග ආහාරයට ගැනීම නිසා තේක්ක කැලය තුළ ඇති ආහාර ප්‍රමාණයද දැන් දැන් පහවයෑමේ ලකුණු පහළ වී ඇත. මෙහි මූලික ලක්ෂණයක් වශයෙන් පෙනී යන්නේ මෙම අලි ආහාර සොයා යාමේ දී විශාල වශයෙන් තේක්ක ගස්වල පොතු ගැලවීමට අමතරව ගස් උදුරා දැමීම පවා සිදුකර ඇති බැවිනි. තවද උසට වැඩුණු මාන පඳුරු හැර වෙනත් අලීන්ට ප්‍රයෝජනයට ගතහැකි තණ බිමක් මෙම තේක්ක කැලෑව තුළ නැති තරම්ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ගම්මුන් වවන භෝග කඩා වඩා ගැනීමට හා ගැමියන් විසින් වගා කරනු ලබන කවර භෝගයක් වුවද කා දැමීමට වියළි කාලය තුළ මෙම සතුන් පෙළඹී ඇත.

වැඩිහිටි ගෑණු අලින් විසින් කැටුව එනු ලබන අලි පැටවුන් විසින් ද තමන්ගේ ගෙවතු වගාවන් විනාශ කරන බව එම ගම්වල නිවැසි ගැමියන් දැක ඇත. මේ අන්දමේ හැසිරීමක් අලින් තුළ දක්නට ලැබීම සාමාන්‍ය දෙයක් නොවන අතර අතිශයින්ම බලාපොරොත්තු සුන් වූ තත්වයන් තුළ දැකිය හැකි හැසිරීම් රටාවක් බට අපගේ හැඟීමයි. එවැනි තත්ත්වයන් වඩාත්ම ප්‍රදර්ශනය වනුයේ අලි ගැටුම උග්‍රව පවතින ප්‍රදේශයන් වන නෙලුවගල, පුබුදුගම හා වදිනාහෙලයාය යන ප්‍රදේශවලය.

අපගේ අත්දැකීම් අනුව වෙඩිපහර වලට ලක් වී, තුවාල සිදුකරනු ලැබූ අලි පැටවුන් හා වලවල් වල හා අනාරක්ෂිත ලිංවල වැටී මියගිය අලින්ගේ සංඛ්‍යාවද සැලකිය යුතු බව මෙහිදී සඳහන් කිරීම වැදගත්ය. එසේම වස පානය කිරීමේ හේතුවෙන් අකාලයේ මියගිය අලින්ගේ මළසිරුරුද මෙම ප්‍රදේශයේ තිබී හමුවූ අවස්ථා බොහෝය. මෙම ප්‍රදේශයේ ගොවීන් පාරම්පරිකව පවත්වාගෙන ආ අලි එලවීමේ ක්‍රමයන් වශයෙන් මහත් ශබ්ද නැගීම, රතිඤ්ඤා පත්තුකිරීම, ගිනි ගොඩවල් ගැසීම, ලන්තෑරුම් පත්තු කිරීම ආදිය සඳහන් කළ හැකිය. කෙසේ වෙතත්, කාලයාගේ ඇවෑමෙන් මෙම ක්‍රමයන්ට අලින් හුරුපුරුදු වීමේ ලක්ෂණයක් අලින් පෙන්වන අතර, මෙම ප්‍රදේශයේ අලි එලවීමට තැත්කරන පුද්ගලයන් වෙත කඩා වැදීමේ සිද්ධීන් ද මෙම අධ්‍යයනය තුළදී වාර්තා විය.

## මෙම අධ්‍යයනයේ අරමුණු

1. ගම්මුන් අතින් අලින් පීඩාවට ලක්නොවෙන පරිද්දෙන් මිනිසුන්ට ද අවදානමෙන් ජීවත් වීමට සිදුනොවන පරිද්දෙන් අලි මිනිස් ගැටුම සිදුනොවීමට ප්‍රතිකාරාත්මක පියවර යෝජනා කිරීම.

2. මෙම ගැටුම අවම මට්ටමට අඩුකර ගැනීමට හැකිවන පරිදි අනුගමනය කළ යුතු දිගුකාලීන සංරක්ෂණමය උපාය මාර්ග යෝජනා කිරීම.



අලි රංචුව හඳපානාගල වැවට බැස

**අධ්‍යයනය පවත්වන ලද ප්‍රදේශයේ සිතියම**



# ප්‍රතිඵල

## සාමාජික හා ආර්ථික තොරතුරු

අධ්‍යයනය කරන ලද ප්‍රදේශය තුළ ඇති මුළු ජන සංඛ්‍යාව 20,700 ක් වන අතර එම සංඛ්‍යාවට පවුල් ඒකක 5,741 ක් අයත් වේ. ඔවුන් අතරින් පවුල් 2,173ක් ජීවත්වන්නේ අලි මිනිස් ගැටුම ප්‍රබල වශයෙන් බල පවත්නා ප්‍රදේශය තුළය. මේ පවුල්වලින් බොහෝ දෙනෙක් ම දිළිඳු පවුල් වල ගොවීන් වන අතර, එයින් 95% කගේම දළ වාර්ෂික ආදායම රුපියල් 50,000/- කට අඩුය. ගැටුම ප්‍රබලව පවත්නා ප්‍රදේශය තුල විශේෂ ලක්ෂණයක් ලෙස කැපී පෙනෙනුයේ එම ප්‍රදේශයේ ජීවත්වන පවුල් සියල්ලක් ම පාහේ, ජනසවිලාභීන් හෝ ආහාර මුද්දර මත යැපෙන්නන් වීමයි.

මේ සමීක්ෂණයට අනුව මුළු ප්‍රදේශය තුළ ජීවත්වන පවුල් 66.6% ක්ම ගොවි පවුල් බව අනාවරණය විය. කෙසේ වෙතත් ගැටුම් ප්‍රබලව පවතින ප්‍රදේශය තුළ වෙසෙන ගොවීන්ට තමන් පාරම්පරිකව කරගෙන ආ ගොවි කටයුතු අතහැර දමා අලින් අප්‍රිය කරන බෝගයන්, බොහෝ දුෂ්කරතා මධ්‍යයේ වුවද තෝරා ගැනීමට සිදුවී ඇත. මේවායින් කැපී පෙනෙන බෝග වන්නේ දුම්කොල වගාව හා රටකජු වගාවයි.

මෙම බෝගයන් තුළින් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ ඔවුන් පාරම්පරිකව කරගෙන ආ ගොවි කටයුතු වලින් ලැබූ ප්‍රතිලාභ වලට වඩා බොහෝසෙයින් අඩුය. තවද දුම්කොල වගාව කරන ගොවි පවුල් අතර ඇදුම රෝගය හා හුස්ම හිරකිරීමේ රෝග බහුල ලෙස පැතිරෙන බව ද සමීක්ෂණ මගින් හෙළිවී ඇත. මේ සියල්ල හේතුකොට ගෙන මෙම ප්‍රදේශයේ ගොවීන් දැන් දැන් වඩාත්ම යොමු වන්නේ රජයේ රැකියාවන් සෙවීමට හෝ පැලවත්ත සීනි කර්මාන්ත ශාලාවේ සේවකයන් බවට පත්වීමට හෝ එසේත් නැතිනම් වෙනත් ගම්වල කුලී කරුවන් සේ තම ජීවිත හැඩගසා ගැනීමටය. මේ සියල්ලටම හේතු වී ඇත්තේ මෙම ප්‍රදේශය තුළ පවත්නා අලි මිනිස් ගැටුම්වල ඇති උග්‍රතාවයි.

## බෝගවලට සිදුවී ඇති පාඩු

ගැටුම වඩාත්ම උග්‍ර වී ඇති ප්‍රදේශය තුළ 1993-94 වර්ෂය තුළ උක් ගස් වගා කළ ඉඩම්වලින් අක්කර 380 ක්ම අලි විසින් පාගා, හෝ කා දැමීම නිසා එම ගොවීන්ට සිදුවූ අලාභය මිලියන 8ක් පමණ විය. එසේම එම ප්‍රදේශය තුළ ඉරිඟු වගාවට කළ හානිය මිලියන 1.2 ක් වන බවද පෙනී ගොස් ඇත. කෙසේ වෙතත් මෙම ප්‍රදේශය තුළ දුම්කොළ වගාවට කිසිදු හානියක් මෙම අලින් විසින් කර නැති බව සමීක්ෂණ දත්ත මගින් පැහැදිලි විය. මිරිස් වගාව මෙම අලින් විසින් පාගා දැමීම නිසා සාමාන්‍ය අලාභයක් පමණක් සිදුවූ බව ගොවීන් පවසන ලදී.

## සෞඛ්‍ය ගැටළු

මෙම ප්‍රදේශයේ දුම්කොල වගාකරන ගොවීන් බොහොම-යක්ම එම වගා කටයුතු ආරම්භ කිරීමෙන් පසු ඔවුන්ට හුස්ම

ගැනීමේ අපහසුතා ඇති කරන ලෙඩ රෝග වන ඇදුම වැනි රෝග බහුල ලෙස පැතිරෙන්නට පටන් ගෙන ඇති බවත් පවසන ලදී. මෙයට මූලික හේතුව ලෙස ඔවුන් දැක්වූයේ මෙම බෝගය සඳහා ඔවුන් යොදා ගන්නා අධික කෘමි නාශක හා පොහොර භාවිතය බවයි.

## ආරක්ෂක පියවර

අලින් විසින් බෝග වගාවන් කඩා වඩා ගනු ලැබීම වැලැක්වීම සඳහා ප්‍රදේශයේ ගොවීන් යොදා ගනු ලබන උපක්‍රම කීපයක් පහත දැක්වේ.

1. රතිඤ්ඤා දැල්වීම
2. ගිනිමැල ගැසීම
3. ශබ්ද කිරීම (ඝෝෂා කිරීම)
4. පරීක්ෂාවෙන් සිටීම
5. ගස් මුදුන් වල කුඩාරම් තැනීම
6. ලන්තෑරුම් දැල්වීම

අගල් කැපීම හා විදුලිය කැවූ වැටවල් තැනීම හැරුණු විට අනෙක් සියලු උපක්‍රමයක්ම ගොවීන් විසින් අලින් පලවා හැරීමට යොදවා ගෙන ඇත. විදුලි වැට පැලවත්ත සීනි කර්මාන්තය විසින් උපයෝගි කරගනු ලැබුවද ගම්මුන්ට මෙය හිසරදයක්ව පවතී. ඒ කෙසේද කියතොත් විදුලි වැට මගින් මෙම ප්‍රදේශයේ ගැවසෙන අලින් එම ස්ථාන වලින් පලවා හැරීම නිසා මෙම සතුන් ගම්මුන් වෙසෙන ගම්මානවලට සහ ගම්මුන්ගේ කොරටු වලට හා කුඹුරු වලට කඩා වැදීම බොහෝ විට සිදුවේ. අගල් කැපීම මෙම ප්‍රදේශයේ කිරීමට නොහැකි වන්නේ වැසි කාලයේදී මේවා ගොඩ වීම හේතු කොට ගෙනය. ගැටුම ප්‍රබලව පවතින ප්‍රදේශය තුළ ගොවීන් රතිඤ්ඤා පත්තු කිරීම, ගිනි මැල ගැසීම හා මහත් ශබ්ද ඝෝෂා කිරීම අනෙක් උපක්‍රම අතර වඩාත් ඵලදායක, කැපීපෙනෙන උපක්‍රමයන්ය. කෙසේ වෙතත් මෙම ප්‍රදේශ වාසීන් විසින් යොදා ගනු ලබන ඉහත සඳහන් උපක්‍රම වලට හුරුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒවායින් මෙම සතුන් බියට පත්වී එම ප්‍රදේශයෙන් ඇත්වෙනවා වෙනුවට, එසේ කරනවුන් පිටුපස හඹා ගොස් ඔවුන්ගේ ගේ දොර පවා කඩා බිඳ දැමූ අවස්ථා කීපයක් ගැනද වාර්තා වී ඇත.

## දේපොළ හානි

ගැටුම පවත්නා ප්‍රදේශය තුළ වෙසෙන සෑම පවුලකම වගේ ගේ දොරවලට කිසියම් හෝ ආකාරයක හානියක් මෙම අලින් විසින් සිදු කර ඇත. බොහෝ අවස්ථාවලදී මෙම අලින් විසින් බිඳ දමනු ලබන්නේ මෙම නිවෙස් වල පිටුපස කුස්සි සාදා ඇති කොටසයි. මෙසේ පිටුපස කොටස බිඳ දමා එහි ඇති ධාන්‍ය කෑමේ සිරිතක් මෙම සතුන් තුළ දක්නට ලැබේ. මෙසේ දේපොළ විනාශ කරන සතුන් බොහෝ විට පිරිමි සතුන් වන අතර බොහෝ ගම්වාසීන් විසින් එම සතුන් නම් වලින් හඳුනාගෙන ඇත. ගැටුම ප්‍රබලව පවත්නා ප්‍රදේශ තුළ, 92/93 වර්ෂ දෙක ඇතුළත පමණක් තාවකාලික නිවාස 20




ක් ඇතුලුව නිවාස 125 ක් කඩා බිඳ දමා ඇති බව අප කළ සමීක්ෂණයකින් හෙළිවිය. මෙයින් විශාල හානියක් කර ඇත්තේ පුබුදුගම ගම්මානය තුළය.

## අලි සංඛ්‍යාව

වනජීවි අඩවි කාර්යාලයෙන් ලබාගත් තොරතුරු අනුව මෙම ප්‍රදේශය තුළ අලි රංචු කීපයක් සිටින බව හෙළි කර ගන්නා ලදී. මෙයින් 90 ක පමණ අලි රංචුවක් පුබුදුගම ප්‍රදේශයේ වාසය කරයි. කෙසේ වෙතත් හඳපානගල අලි රංචුව කුඩා පවුල් ඒකක කීපයකින් සැදුම්ලත් රංචුවක් වන අතර ඔවුන් සියල්ලම වියලි කාලයේදී පමණක් ඒක රාශි වී හඳපානාගල වැවේ පොදු ජල සම්පත බෙදා හදා ගැනීමට හුරු පුරුදුව සිටී. මේ හේතුවෙන් එම රංචුවේ සංඛ්‍යාව වියලි කාලය තුළ එනම් ජූලි, අගෝස්තු, සැප්තැම්බර් යන මාස වල ඉතා ඉහල සංඛ්‍යාවක එනම් 120 ටත් 140 ටත් අතර ප්‍රමාණයට වැඩි වන අතර වැසි ලැබීමත් සමග ක්‍රමයෙන් තුනී වී ගොස් ඉතිරි කාලය තුළ මෙම ප්‍රදේශයේ 20 ටත් 40 ටත් අතර ස්ථිරව වෙසෙන අලිරංචුවක් සිටින බව එක් රැස් කළ දත්ත අනුව හෙළිවිය.

## මරා දමනු ලැබූ අලි සංඛ්‍යාව

1992,93,94 යන අවුරුදු 3ක් ඇතුලත ගැටුම උග්‍රව පවතින ප්‍රදේශය තුළ පමණක් අලි 11ක් මැරී වැටී සිටිනු දක්නට ලැබිණ. මොවුන් ගෙන් බොහෝ දෙනෙකු මරුමුවට පත්වී සිටියේ වෙඩි වැදීම හේතුවෙනි. නෙළුවගල ප්‍රදේශයේ අලියෙකු වෙඩි වැදී මැරී සිටි අතර මහආරගම වස ශරීරගත වීම හේතුවෙන් අලියෙකු මැරී සිටිනු දක්නට ලැබිණි. කෙසේ වෙතත් අපගේ පෞද්ගලික මතය නම් මෙම ප්‍රදේශය තුල මැරුණු අලි සංඛ්‍යාව මීට වඩා වැඩි සංඛ්‍යාවක් බවයි. මෙම ප්‍රමාණය තිම කිරීමෙන් පසුවත් එම ප්‍රදේශයේ ගැවසුණු "තනි දලයා" නම් එක දලක් සහිත ඇතා යාල බ්ලොක් 5 ප්‍රදේශයට තුදුරු වල්ලිඅම්මාර ප්‍රදේශයේ වෙඩි වැදීමේ හේතුවෙන් මිය ගොස් සිටි බව වාර්තා විය. මීට අමතරව සෑම අලියෙකුගේම ඇඟ පුරාම වෙඩි වැදීමේ හේතුවෙන් හටගත් තුවාල රාශියක් ඇති බව සියල්ලන්ම දන්නා කරුණකි. මෙසේ තුවාල ලබා ඇති අලින් බොහොමයක් ම අවු. 20,30, ත් අතර වයස්

සීමාවල පිරිමි අලින් බව වනජීවී නිලධාරීන්ගේ වාර්තා මගින් හෙළි වී ඇත.



අලින් විසින් කඩා දමන ලද නිවසක්. 1992 හා 1993 වර්ෂ දෙක ඇතුළත පමණක් තාවකාලික නිවාස 20ක් ඇතුළුව නිවාස 125ක් පමණ මෙසේ අලින් විසින් කඩාදමන ලද බව සමීක්ෂණයකින් අනාවරණය වී ඇත.

## හඳුනාගත් අලින්

අධ්‍යයන කාලය තුළ අලින් කීප දෙනෙකු එම ප්‍රදේශවාසීන් විසින් දෙනු ලබන නම්වලින් හඳුනාගනු ලැබ ඇත.

එනම්,

- කබරයා නොහොත් කබරමාලයා
- තනිදලයා
- තත්පරයා
- බීරි අලියා

මෙම අලි 4 දෙනා, මෙම ප්‍රදේශයේ (මෙම ප්‍රදේශය තුළ සිදු වී ඇති) ගෙවල් බිඳීම් හා ගෙවතු පාළු කිරීම් රාශියකටම වගකිව යුතු බව ප්‍රදේශ වාසීන් විසින් ප්‍රකාශ කරන ලදී. මෙම අලින් නිදැල්ලේ හැසිරෙන පිරිමි අලින් බව ද ගම්මුන් පවසති.

**වාසභූමි ධාරිතාව** යාල බ්ලොක් 3,4 හා 5

## ජල සම්පත්

යාල **බ්ලොක්** 4 ප්‍රදේශය තුළ විශාල ප්‍රමාණයේ වැව් 09 ක් ඇති බව අප කළ සමීක්ෂණයේදී හෙළිවිය. මෙයින් විශාලතම වැව වන්නේ පහළ සුවදන්ආර වැවයි. මෙම සියළුම වැව් වැසි ජලයෙන් පෝෂණය වන අතර ඉහළ සුවදන්ආර වැවේ පමණක් ස්වාභාවික ජල උල්පතක් පවතී. මෙම වැවේ ධාරිතාව කියුබික් මීටර් 400,000 ක් පමණ වේ. තවද මෙය සැල්වීනියා වලින් වටවී ඇති බැවින් ප්‍රතිසංස්කරණය කිරීම කළ යුතුව ඇත. පහළ සුවදන්ආර වැවේ ධාරිතාවය කියුබික් මීටර් 800,000 ක් පමණ වේ. මෙයට වැසි කාලයේදී ආරවල් දෙකකින් ජලය සැපයෙන අතර මෙය ප්‍රතිසංස්කරණය කිරීමෙන් ජල ප්‍රශ්නය බොහෝ දුරට මගහරවා ගත හැකිය. කෙසේ වෙතත් මෙම ප්‍රදේශය තුළ විශාල වැව් පවත්වාගෙන යාම එහි වෙසෙන සත්වයින්ට හිතකරද අහිතකරද යන්න සොයා බැලීම ගැන අධ්‍යයනයක් කිරීම කළ යුතුව ඇත. වියළි කාලය තුළ මෙම වැව ද සිඳී යාමේ තර්ජනයට ලක්වේ. මෙයට මූලිකම හේතුව වශයෙන් දකින්නේ මෙම වැව නිසියාකාරව ප්‍රතිසංස්කරණය කර නැති බවයි. තවත් ප්‍රධාන වැව් දෙකක් යාල බ්ලොක් 3 හි පිහිටා ඇත. තලාකොල වැව හා ඌරළුවැවයි. තවද යාල බ්ලොක් පහෙහි මනා ලෙස ප්‍රතිසංස්කරණය කරන ලද මල්වාරිය වැව පිහිටා ඇත. මෙම ප්‍රදේශයට තවත් සතුන් ගෙන ඒමට පෙර මල්වාරිය වැව හැර අනෙකුත් සියළුම වැව් සඳහා ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලක් යෙදීම ඉතාම අත්‍යාවශ්‍ය බව අපගේ හැඟීමයි.

## අලින් සඳහා ආහාර

යාල බ්ලොක් 3 හා 5 කොටස්වල අලින් රඳවාගැනීමේ ධාරිතාව නිගමනය කිරීමට අධ්‍යයනයක් වහාම ආරම්භ කිරීම කළ යුතුව ඇත. බැලූ බැල්මට පෙනෙන තක්සේරුවට අනුව අලින්ගේ ආහාරයට ගන්නා කොල අතු ආදිය මෙම කොටස්වල අඩුවක් නොමැතිව තිබෙන බව පෙනී යයි. කෙසේ වෙතත් බ්ලොක් 3 හා 4 ප්‍රදේශ ඝන වනාන්තර සහිත ප්‍රදේශයන් බැවින් හා බිම කිසිදු කුඩා ප්‍රමාණයේ පැලෑටි දක්නට නොලැබෙන බැවින් එවන් පරිසරයක් අලින් සඳහා සුදුසු නොවන බව අපගේ හැඟීමයි. අධ්‍යයනයකින් පසු මෙම ප්‍රදේශය අලින් සඳහා නුසුදුසු යයි තීරණය වුවහොත් තවත් සතුන් එම ප්‍රදේශයට ගෙන ඒමට නම්, එම ප්‍රදේශය අලින්ගේ වාසභූමියක් බවට පත්කිරීම සිදුවනු ඇත. මෙය කළ හැක්කේ පාරිසරික ප්‍රශ්න බලපාන්නේ නැත්නම් පමණි. මේ යටතේ පවතින් යටි වගාවන් කප්පාදු කිරීමට සිදු කළ යුතුව ඇතැයි අපගේ හැඟීමයි. එසේ කරනවානම් කළ යුතුව ඇත්තේ පරිසර හානිය අවම තත්වයක පවත්වා ගෙනය. එම අධ්‍යයනයෙන්ම මෙම ප්‍රදේශය තුළ අලින්ට අවශ්‍ය ආහාර වැඩිදියුණු කිරීම පිළිබඳව ද අධ්‍යයනයක් ඇතුළත් කළ යුතු වේ. එසේ නැතිව තවත් සතුන් මෙම ප්‍රදේශයට ගෙනඒම යෝග්‍ය නොවන බව අපි තරයේ කියා සිටිමු.

## සංක්‍රමණය වන්නාවූ ගමන් මාර්ග

මෙම ගමන් මාර්ග නිගමනය කරනු ලැබුවේ ගතවූ වසර කීපය තිස්සේ සතුන් භාවිතා කර ඇති සංක්‍රමණික මං පෙත් පිරික්සීමෙනි. හඳපානාගල සිට දෙමෝදර හරහා යාල පහ, තුන හා හතර වන කොටස්වලට පයින් ගමන් කොට මෙම අඩිපාරවල් සොයාගනු ලැබීය. දැනට මෙම මංසලවල් පැලවත්ත විදුලි වැට හේතුවෙන් හරස් වී ඇත. කෙසේ වෙතත් අලින් සඳහා හඳපානාගල සහ යාල සම්බන්ධ කරන ඉදිරියේ දී ඉදිකිරීමට බලාපොරොත්තුවන මංසල කුඩා ඔය හරහා දෙමෝදරට සම්බන්ධව ඉදිකරන්නේ නම් යෝග්‍ය යයි අපි යෝජනා කරමු.

## ප්‍රධාන අවහිරතාවන්

මෙම අධ්‍යයනය මගින් යෝජනා කර ඇති විසඳුම් ක්‍රියාමාර්ග ක්‍රියාවේ යෙදවීමට ඇති ප්‍රධානතම බාධක මෙහි පහත දැක්වෙන පරිදි සාරංශ කොට දැක්විය හැකිය.

අ. පීඩාවට ලක්ව ඇති ප්‍රදේශවල පදිංචිකරුවන් වෙනත් ස්ථානවල පදිංචි කරවීමට බලධාරීන් දක්වන අකමැත්ත. මෙය බොහෝ දුරට දේශපාලන හේතූන් මත දක්වන අකමැත්තක් විය හැකිය.

ආ. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති යෝජනා ක්‍රියාත්මක කිරීම ගැන කෙලින්ම වගකිව යුතු රජයේ බලධාරීන්ගේ අදක්ෂකම.

ඇ. මෙම ප්‍රදේශය තුළ සිදුකෙරෙමින් පවත්නා ක්‍රියාකාරකම් වෙනුවෙන් තමන්ට ලැබෙන කවර හෝ මූල්‍යාධාර තමන්ට අහිමි වී යනු ඇතැයි යන බිය නිසා එම කටයුතුවල නියැලී සිටින ආත්මාර්ථකාමී සංවිධාන මගින් සිදුකෙරෙන අනිසි බලපෑම්. මෙම සතුන් කෙරෙහි අනුකම්පාවෙන් විදේශ රටවලින් ලබා දෙන මුදල් ආධාර පවා මේ අයගේ සාක්කුවට යයි.

## නිර්දේශ

1. සමාජ ආර්ථික බලපෑම අඩුකරලීමට පුරුද්දක් වශයෙන් මිනිසුන් මරණ හා වගා පාළුකරන සතුන් අල්ලා වෙනත් ස්ථානවලට පිටත් කර යැවීම. වෙනත් ස්ථානවලට යැවීමෙන් පසු ඔවුන් හැසිරෙන තැන් සොයාගැනීමට ගුවන්විදුලි ටෙලිමෙට්‍රි පතිවුඩ ක්‍රම භාවිතා කරමින් උත්සාහ දැරිය යුතුය.

2. හඳපානාගල ප්‍රදේශය හා යාල ජාතික වනෝද්‍යානය සම්බන්ධීකරණය කරන අලි මංසලක් විවෘත කළ යුතුය. යෝජිත අලි මංසල දෙමෝදර හරහා යාල බ්ලොක් 5 හා 4 හා 3 සම්බන්ධ කරන එකක් නම් වඩාත් යෝග්‍යයය. ඉන් අනතුරුව මෙම අලි මංසල තාවකාලික එකක් විය යුතුද නැත හොත් ස්ථිර එකක් විය යුතුද යන්න නිගමනය කිරීම උදෙසාත් සතුන්ගේ සැරුම් රටාවන් පිළිබඳ දැනගැනීමටත් පසු අධ්‍යනයක් සිදු කළ යුතුය.

3. පවුල් 80 සිට 90 දක්වා වූ සංඛ්‍යාවකින් යුත් තෙලුවාගල පදිංචි කරුවන් සුදුසු අලුත් ස්ථානයක නැවත පදිංචි කළ යුතුය.

4. සතුන් සඳහා ප්‍රමානවත් තරම් ඉඩකඩ සැපයිය යුතුය. පැලවත්ත සීනි කර්මාන්ත භූමි භාගයේ මායිම් නැවත සකස් කළ යුතු අතර පැලවත්ත 03 වන කොටසේ වූ උක් වගා ප්‍රදේශය සතුන් වෙනුවෙන් මුදාහල යුතුය.

5. යාල 03,04 සහ 02 වන කොටස්වල, හඳුනාගෙන ඇති වඩාත් ඵලදායක දිය වලවල් අලුත්වැඩියා කිරීම හෝ නැවත ඉදිකිරීම සිදුකළ යුතුය.

6. බෝග වගාවන් පාලුවීම සහ මිනිස් ජීවිත නැති වීම වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා ඇති රක්ෂණ ක්‍රමයක් අනුගමනය කිරීම පිණිස යතාර්ථවාදී ප්‍රවේශ ක්‍රමයක් ඇතිකර ගත යුතුය.

## දීර්ග කාලීන

1. යාල බ්ලොක් 01,04 හා 03 යන ප්‍රදේශ වලට අලින් යැවීම පිණිස ඒවායේ ධාරිතාවය පිළිබඳ අධ්‍යයනයන් සිදුකිරීම.

2. යාල බ්ලොක් 01, 03, 04 සහ 05 යන සතුන් ගේ වාසභූමි විශේෂයෙන් සතුන්ට තණ කෑවීම පිණිස පෝෂිත ප්‍රදේශ වශයෙන් නගාසිටුවිය යුතුය.

3. මෙම ප්‍රදේශයේ වෙසෙන අලින් ගේ හැසිරීම් හා සැරිසැරුම් රටාවන් අධ්‍යයනය කිරීම පිණිස පර්යේෂණ ඒකකයක් ආරම්භ කිරීම. යාල වනෝද්‍යානය හා සසඳා බලන කළ උක් වගාවක් පවත්වා ගෙන යෑමේ සමාජ, පාරිසරික හා ආර්ථික ලාභදායිත්වය පිළිබඳ අධ්‍යයනයක් සිදුකළ යුතුය.

4. පීඩාවට පත් ප්‍රදේශය තුළ සිදුව ඇති වගා පාළුවීම් වෙනුවෙන් වන්දි මුදල් ගෙවීමට ප්‍රතිවිරෝධතා පසිඳලීමේ කමිටු ඇතිකළ යුතුය.